# ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 21 දරන ශ්‍රී ලංකා ලාදුරු රෝග මර්දන සංගමය පනත

[සහතිකය සටහන් කළේ 1974 ජූනි මස 27 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදි

(1974 ජූලි මස 12 වන දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදි)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදි

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

# ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 21 දරන
# ශ්‍රී ලංකා ලාදුරු රෝග මර්දන සංගමය පනත

[සහතිකය සටහන් කළේ 1974 ජූනි මස 27 වන දින]

එල්. ඩී.—ඕ. 34/71

## ශ්‍රී ලංකා ලාදුරු රෝග මර්දන සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"ශ්‍රී ලංකා ලාදුරු රෝග මර්දන සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක්, එකී සංගමයේ සාමාජික යන් එකඟ වන රීති අනුව එකී සංගමයට සම්බන්ධ සියලු කරුණු ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවෙහි මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු කිපය මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථක ව ක්‍රියාත්මක කර හා කරගෙන ගොස් ඇති හෙයින් සහ එම සංගමය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහාජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 21 දරන ශ්‍රී ලංකා ලාදුරු රෝග මර්දන සංගමය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඩු නාමය.

2. මේ පනත ආරම්භවීමේ දින සිට හා ඊට පසු, (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන) ශ්‍රී ලංකා ලාදුරු රෝග මර්දන සංගමයේ තත් කාලයෙහි සිටින සාමාජිකයන් ද එකී සංගම යේ සාමාජිකයන් වශයෙන් එදිනට පසු ඇතුලත් කර ගනු ලබන යම් හා ඇතුලත් කර ගනු ලබන තාක් තැනැත්තන් ද (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී ලංකා ලාදුරු රෝග මර්දන සංගමය" යන නාමය යටතේ අඛණ්ඩ පැවැත්මක් සහිත නීතිගත සංස්ථාවක් විය යුතු අතර, එකී නාමයෙන් සියලු අධිකරණයන් හි නඩු පැවරීම හා නඩු පවරනු ලැබීම කළ හැකිය. තව ද එකී නාමයෙන් පොදු මුද්‍රාවක් පාවිච්චි කිරීමේ හා සංස්ථාවේ අභිමතය පරිදි එය අමුතු කිරීමේ පූර්ණ බලය හා අධිකාරය එයට තිබිය යුතුය. ශ්‍රී ලංකා ලාදුරු රෝග මර්දන සංගමය සංස්ථාගත කිරීම.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) ශ්‍රී ලංකාවෙහි ලාදුරු රෝගය වැළැක්වීමේ හා මර්දනය කිරීමෙහිලා හැකි සෑම අයුරකින් ම ආධාර කිරීම ;

(ආ) සංගමයේ අරමුණු ම හා පරමාර්ථ ම ඇති යම් යෝජනා ක්‍රම යක් හෝ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ආණ්ඩුව හෝ යම් පළාත් පාලන ආයතනයක් හෝ ලංකාව තුළ හෝ විදේශ යක අන් කිසි සංගමයක් සමඟ සහයෝගයෙන් ක්‍රියා කිරීම ;

I—ඒ 00868—8,950 (73/08)

(ඈ) රෝග නිධාන, ලක්ෂණ හා ලකුණු, රෝගය වැළැක්වීම හා රෝගයට ප්‍රතිකාර කිරීම සම්බන්ධයෙන් තොරතුරු දැන්වීම;

(ඇ) රෝග මර්දනය කිරීම පිණිස ආරම්භ කරනු ලබන වැඩපිළිවෙලවල් සම්බන්ධයෙන් මහාජනයාට දැනුම්දීම, ඔවුන්ගේ උනන්දුව ඇතිකරවීම හා එකී වැඩපිළිවෙලවල් ක්‍රියාත්මක කිරීමෙහි ලා ඔවුන්ගේ සහයෝගය ලබා ගැනීම;

(ඉ) රෝගීන්ට හා ඔවුන් ගෙන් යැපෙන්නන්ට ආධාර දීම පිණිස හා රෝගීන් පුනරුත්ථාපනය කිරීම පිණිස පහසුකම් සැලැස්වීම; හා

(ඊ) රෝගය වළක්වාලීම හා මර්දනය කිරීම සම්බන්ධයෙන් වූ පර්යේෂණ කටයුතු සඳහා හැකි සෑම අයුරකින් ම ආධාර කිරීම.

සභාව.

4. සංගමයේ නිලධරයන්ගෙන් හා සංස්ථාවේ රීති අනුව සපයනු ලබන වෙනත් සාමාජිකයන්ගෙන් හා එකී රීතිවලින් විධිවිධාන සලස්වනු ලබන පරිදි යම් සුදුසුකම් ඇත්තා වූත් යම් බලතල ක්‍රියාත්මක කරන්නා වූත් යම් කාලසීමා සඳහා වූත් තැනැත්තන් සංඛ්‍යාවක ගෙන් සමන්විත වන සභාව යනුවෙන් හැඳින්වෙන විධායක මණ්ඩලයක් විසින් සංස්ථාවේ කටයුතු පරිපාලනය කරනු ලැබේ.

සංස්ථාවෙන් ගෙවිය යුතු හා සංස්ථාවට අයවිය යුතු ණය.

5. මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවෙහි පවත්නා සංගමයේ සියලු ම ණය හා වගකීම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, සංගමයට අය විය යුතු සියලු ම ණය හා සංගමයට ගෙවිය යුතු සියලු ම දායක මුදල් මේ පනතේ කාර්යයන් සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතුය.

දේපළ සතුව සිටීමට සංස්ථාව සතු බලය.

6. යම් මිලට ගැනීමක, ප්‍රදානයක, ත්‍යාගයක, හුවමාරු කිරීමක ප්‍රකාර හෝ අන් ආකාරයකින් සංස්ථාව සතු කරනු ලබන චංචල හා නිශ්චල යන දෙවර්ගයේ ම දේපළ භාර ගැනීමටත් සතුව සිටීමටත් නීතිය අනුව සංස්ථාවට හැකියාව හා ශක්තතාව තිබිය යුතුය; තව ද එකී දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කර ගැනීමේ හා අන් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ පනතේ කාර්යයන් සඳහා සහ සංස්ථාවේ තත් කාලයෙහි බලපවත්නා රීතිවලට යටත්ව එකී සියලු දේපළ සංස්ථාව සතු විය යුතුය.

සංස්ථාවේ මුද්‍රාව.

7. ප්‍රධාන ලේකම් හා සංස්ථාවේ රීතිවලින් තත් කාර්යය සඳහා යථා පරිදි බලය පවරනු ලැබූ සංස්ථාවේ සභාවේ සාමාජිකයකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර හෝ සාධන පත්‍රයකට තබනු නො ලැබිය යුතුය. ඔවුන් දෙදෙනා විසින් තමන් පැමිණ සිටීමේ ලකුණක් වශයෙන් තම අත්සන් සාධන පත්‍රයට තැබිය යුතුය. එකී අත්සන් තැබීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට ස්වාධීනව විය යුතුය.

රීති සෑදීමේ බලය.

8. සාමාජිකයන් ඇතුළත් කරගැනීම, ඉල්ලා අස්කර ගැනීම හෝ නෙරපීම සඳහා ද සභාවේ සහ සංගමයේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ හා සේවකයන්ගේ යුතුකම් ඉටුකරවීම සඳහා ද රැස්වීම්වල දී පිළිපැදිය යුතු ක්‍රියාපටිපාටිය සඳහා ද සංගමයේ කටයුතු

කරගෙන යාම සඳහා ද සංගමයේ දේපළ පරිපාලනය කිරීම හා කළමනාකරණය සඳහා ද සාමාජිකයන් විසින් ගෙවිය යුතු දායක මුදල් නිශ්චය කිරීම හා එකී දායක මුදල් අයකර ගැනීම සඳහා ද නැතහොත් සාමාන්‍යයෙන් සංගමයේ කටයුතු කළමනාකරණය හා එකී පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා 9 හා 10 වන වගන්තිවල විධිවිධානවලට යටත්ව සංස්ථාව විසින් කලින් කල රීති සෑදීම නීත්‍යනුකූල විය යුතුය.

9. මේ පනතට යාකොට ඇති උපලේඛනයෙහි දැක්වෙන රීති සියලු කාර්යයන් සඳහා සංස්ථාවේ රීති විය යුතුය : උපලේඛනයෙහි දක්වෙන රීති සංස්ථාවේ රීති විය යුතු බව.

එසේ වුවද සංස්ථාව විසින් මින් මතු අලුත් රීති සෑදීම හෝ පවත්නා රීති හෝ සංස්ථාව විසින් මින් මතු සාදනු ලබන රීති වෙනස් කිරීම, සංශෝධනය කිරීම හෝ ඒවාට යමක් එකතු කිරීම මේ වගන්තියේ අඩංගු කිසිවකින් වලක්වන ලෙස තිරණය කිරීම හෝ තේරුම් ගැනීම නොකළ යුතුය.

10. සම්පූර්ණ දින අටකට නොඅඩු කාලයකට පෙර දැන්වීමක් කරනු ලැබූ විශේෂ යෝජනාවක් අනුව විනා හා එකී යෝජනාව සංගමයේ සාමාජිකයන්ගේ මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක වැඩි ඡන්දයක් සම්මත කරනු ලැබුවේ නම් මිස, මේ පනතට යාකොට ඇති උපලේඛනයෙහි දැක්වෙන කිසිම රීතියක් වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම හා මින් මතු කිසිම රීතියක් සෑදීම කරනු නොලැබිය යුතුය. රීති සංශෝධනය කිරීම යනාදිය.

11. මේ පනතෙහි සඳහන් අයිතිවාසිකම් හා ඒවා අනුව, ඒවා මගින් හා ඒවා යටතේ හිමිකම් කියාපාන අයගේ හැර ජනරජයේ හෝ යම් දේශපාලන මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අන් කිසි තැනැත්තකුගේ අයිතිවාසිකම් කෙරෙහි මේ පනතෙහි අඩංගු කිසිවක් හානිකර වීම හෝ බලපෑම නොවිය යුතුය. ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

## උපලේඛනය

### ශ්‍රී ලංකා ලාදුරු රෝග මර්දන සංගමයේ ව්‍යවස්ථා මාලාව හා රීති

1. සංගමයේ නාමය ශ්‍රී ලංකා ලාදුරු රෝග මර්දන සංගමය වන්නේ ය. නාමය.

2. ලාදුරු රෝගය වැළැක්වීමෙහි හා මර්දනය කිරීමෙහි ලා බලවත් උනන්දුවක් දක්වන හා එකී වැළැක්වීමේ හා මර්දනය කිරීමේ කටයුතු සඳහා මුදලින්, සේවයෙන් හෝ අන් කිසි ආකාරයකින් ආධාර කරන තැනැත්තන්ගෙන් සංගමය සමන්විත වන්නේ ය. ස්වභාවය.

3. සංගමයේ අරමුණු හා පරමාර්ථ පහත සඳහන් ඒවා වන්නේ ය:— අරමුණු හා පරමාර්ථ.

(අ) ශ්‍රී ලංකාව තුළ ලාදුරු රෝගය වැළැක්වීමෙහි හා මර්දනය කිරීමෙහි ලා හැකි සෑම අයුරකින් ම ආධාර කිරීම;

(ආ) සංගමයේ අරමුණු ම හා පරමාර්ථ ම ඇති යම් යෝජනා ක්‍රමයක් හෝ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ආණ්ඩුව හෝ යම් පළාත් පාලන ආයතනයක් හෝ ශ්‍රී ලංකාව තුළ හෝ විදේශයක අන් කිසි සංගමයක් සමග සහයෝගයෙන් ක්‍රියා කිරීම;

(ඇ) රෝග නිධාන, ලක්ෂණ හා ලකුණු, රෝගය වැළැක්වීම හා රෝගයට ප්‍රතිකාර කිරීම සම්බන්ධයෙන් තොරතුරු දැක්වීම;

(ආ) රෝග මර්දනය කිරීම පිණිස ආරම්භ කරනු ලබන වැඩ පිළිවෙලවල් සම්බන්ධයෙන් මහාජනයාට දැනුම්දීම, ඔවුන්ගේ උනන්දුව ඇති කරවීම හා එකී වැඩ පිළිවෙලවල් ක්‍රියාත්මක කිරීමෙහි ලා ඔවුන්ගේ සහයෝගය ලබා ගැනීම;

(ඉ) රෝගීන්ට හා ඔවුන්ගෙන් යැපෙන්නන්ට ආධාර දීම සඳහා හා රෝගීන් පුනරුත්ථාපනය කිරීම පිණිස පහසුකම් සැලැස්වීම; හා

(ඊ) රෝගය වළක්වාලීම හා මර්දනය කිරීම සම්බන්ධයෙන් වූ පර්යේෂණ කටයුතු සඳහා හැකි සෑම අයුරකින් ම ආධාර කිරීම.

**සාමාජිකත්වය.**

4. සංගමය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත වන්නේ ය:—

(අ) තත් කාර්යය සඳහා තබා ඇති නාම ලේඛනයෙහි දැනට නම් ඇතුළත් කරනු ලැබ සිටින සියලුම තැනැත්තන්ගෙන්; හා

(ආ) පහත සඳහන් සාමාජිකත්ව වර්ගවලින් යම් වර්ගයකින් නාම ලේඛනයෙහි මින් මතු නම් ඇතුළත් කරනු ලැබ සිටින අන් කිසි තැනැත්තන්ගෙන්:—

(i) ගරු සාමාජිකයෝ—සංගමයේ පරමාර්ථ වැඩිදියුණු කිරීමෙහි ලා කරනු ලබන සේවය නිසා පිළිගත යුතු යයි සභාවට පෙනෙන තැනැත්තකුට කවර හෝ අමතර සුදුසුකමක් රහිතව සංගමයේ ගරු සාමාජිකයකු වන ලෙස ආරාධනා කරනු ලැබේ.

(ii) යාවජීව සාමාජිකයෝ—රුපියල් 100 හෝ වැඩි දායක මුදලක් ගෙවන තැනැත්තෙක් සභාවේ අභිමතය පරිදි සංගමයේ යාවජීව සාමාජිකයකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබීමට සුදුසු වන්නේ ය.

(iii) සාමාන්‍ය සාමාජිකයෝ—සංගමයේ අරමුදලට වර්ෂයකට රුපියල් 10 ක අඩුම දායක මුදලක් ගෙවන තැනැත්තෙක් ඔහුගේ ඉල්ලීම පිට සාමාන්‍ය සාමාජිකයකු වශයෙන් සභාවේ අභිමතය පරිදි ලියාපදිංචි කරනු ලබන අතර, වර්ෂයකට රුපියල් 10 ක අඩුම දායක මුදලක් ගෙවීමෙන් එසේ සාමාජිකයකු වශයෙන් අඛණ්ඩව සිටිය හැකිය.

**අනුශාසකයෝ හා උපඅනුශාසකයෝ.**

5. (අ) ජනරජයේ ජනාධිපතිතුමා, එතුමාණන්ගේ කැමැත්තට යටත්ව සංගමයේ අනුශාසක වන්නේ ය.

(ආ) ගරු අග්‍රාමාත්‍යවරයා, ගරු සෞඛ්‍ය අමාත්‍යවරයා හා ගරු සමාජසේවා අමාත්‍යවරයා, ඔවුන්ගේ කැමැත්තට යටත්ව සංගමයේ උපඅනුශාසකයෝ වන්නාහ.

**ආගමික උපදේශක සභාව.**

6. සංගමය විසින් ආගමික නායකයන්ගෙන් හා ආගමික සංවිධාන හෝ කණ්ඩායම් නියෝජනය කරන අන් ප්‍රමුඛ තැනැත්තන්ගෙන් සමන්විත වන ආගමික උපදේශක සභාවක් පත්කිරීමට පියවර ගත හැකිය.

**නිලධරයෝ.**

7. (අ) සියලුම නිලධරයන් සංගමයේ වයස අවුරුදු විසිඑකට වැඩි සාමාජිකයන් විය යුතුය. ඔවුහු වාර්ෂික මහා සභා රැස්වීමේ දී තෝරා පත්කර ගනු ලබන්නාහ. ඔවුන් නිරායාසයෙන් ම එක් එක් වර්ෂයේ දී ඉවත් විය යුතු අතර දායක මුදල් හිඟ තබා නොසිටී නම් නැවත තෝරා පත්කර ගනු ලැබීමට ඔවුන් සුදුසු විය යුතුය.

(ආ) සංගමයේ නිලධරයන් පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුය:—

(i) සභාපති,
(ii) පස්දෙනකුට නොවැඩි උපසභාපතිවරුන් ගණනක්,
(iii) සභාවේ සභාපති,
(iv) සභාවේ උපසභාපති,
(v) ගරු ලේකම්,
(vi) ගරු භාණ්ඩාගාරික,
(vii) ගරු උපලේකම්,
(viii) ගරු උපභාණ්ඩාගාරික.

8. (1) පරිපාලන සභාවක් විසින් සංගමය පාලනය කරනු ලැබේ. එකී සභාව— සභාව.

(අ) නිලබලයෙන් පත්වන සාමාජිකයන්ගෙන් ;

(ආ) තෝරා පත් කර ගනු ලබන සාමාජිකයන්ගෙන් ; සහ

(ඇ) නම්කර පත් කරනු ලබන සාමාජිකයන්ගෙන්

සමන්විත විය යුතුය.

(2) (අ) නිලබලයෙන් පත්වන සාමාජිකයෝ—සංගමයේ නිලධරයන් සභාවේ නිලබලයෙන් පත්වන සාමාජිකයන් විය යුතුය.

(ආ) තෝරා පත් කර ගනු ලබන සාමාජිකයෝ—එක් අවුරුදු කාලපරිච්ඡේදයක් සඳහා එක් එක් වාර්ෂික මහා සභා රැස්වීමේ දී සභාවට තෝරා පත් කර ගනු ලබන සංගමයේ සාමාජිකයන් පසළොස් දෙනකුට වැඩි නොවිය යුතුය. ඔවුන් නැවත තෝරා පත් කර ගනු ලැබීමට සුදුසු විය යුතුය.

(ඇ) නම්කර පත් කරනු ලබන සාමාජිකයෝ—පහත සඳහන් රාජ්‍ය නිලධරයන්, ඒ ඒ අමාත්‍යවරුන්ගේ අනුමතිය ඇතිව, සභාවෙහි සේවය සඳහා නම්කර පත් කරනු ලැබේ :—

(i) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ හෝ ඔහුගේ නියෝජිතයකු,

(ii) ලාදුරු රෝග මර්දන ව්‍යාපාරය භාර වෛද්‍ය නිලධරයා,

(iii) සමාජ සේවා අධ්‍යක්ෂ හෝ ඔහුගේ නියෝජිතයකු,

(iv) සභාව විසින් නිශ්චය කරනු ලබන සෙසු දෙපාර්තමේන්තුවල ගණනින් පහකට නොවැඩි නියෝජිතයන්,

(v) (අ) අනුබද්ධ සංගම්වල ;

(ආ) ලාදුරු රෝගය වැලැක්වීමෙහි හා පාලනය කිරීමෙහි ලා නියුක්ත සංවිධානවල,

(ඇ) සෙසු සමාජ සුභසාධක සංවිධානවල,

(ඈ) සංගමයේ පරමාර්ථ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන තැනැත්තන්ගේ

නියෝජිතයන්.

(3) යටත් පිරිසෙයින් මසකට එක් වරක්වත් සභාව රැස්විය යුතු අතර සංගමයේ අරමුණු හා පරමාර්ථ කරගෙන යාමට අවශ්‍ය යයි හෝ යෝග්‍ය යයි සලකනු ලබන සියලු ම හෝ යම් පියවර ගැනීමට එකී සභාවට බලය තිබිය යුතුය. සභාපති වෙත එවනු ලැබූත් සභාවේ සාමාජිකයන් පස් දෙනකුට අඩු නොවූත් රැස්වීමේ දී කරනු ලැබිය යුතු කටයුතු දැක්වෙන්නා වූත් ලිඛිත ඉල්ලීමක් ලැබී විසිඑක් දිනක් ඇතුළත සභාපති විසින් රැස්වීමක් කැඳවනු ලැබිය යුතුය. සභාපති විසින්, තම මතය අනුව සංගමයේ කටයුතු හේතුකොට ගෙන රැස්වීමක් කැඳවිය යුතු යයි සලකන කවර හෝ අවස්ථාවක දී සභාවේ රැස්වීම් එසේ කැඳවනු ලැබිය යුතුය.

සභාවේ රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් හත් දෙනකු විය යුතුය.

(4) එක් වාර්ෂික මහා සභා රැස්වීමක් හා ඊළග වාර්ෂික මහා සභා රැස්වීම අතර කාලය තුළ දී නිලධරයන් හා තෝරා පත් කර ගනු ලැබූ සාමාජිකයන් අතර ඇතිවන අනියම් පුරප්පාඩුවක් පිරවීමේ බලය සභාවට තිබිය යුතුය. අනියම් පුරප්පාඩු පිරවීම සඳහා තෝරා පත් කරනු ලැබූ සභාවේ නිලධරයන් හෝ තෝරා පත් කරනු ලැබූ සාමාජිකයන් ඔවුන් තෝරා පත් කරනු ලැබීමෙන් පසු ඊළඟ වාර්ෂික මහා සභා රැස්වීම තෙක් ධුර දැරිය යුතුය.

(5) සභාවේ සියලුම රැස්වීම්වල මූලාසනය සභාපති විසින් ද ඔහු පැමිණ නොසිටින විට උපසභාපති විසින් ද දැරිය යුතුය.

(6) සංගමයේ අරමුණු හා පරමාර්ථ කරගෙන යාම සඳහා අවශ්‍ය යයි සැලකෙන නිලධරයන් හා සේවකයන් පත් කිරීමේ හෝ නියුක්ත කිරීමේ හෝ ඔවුන්ගේ සේවය අවසන් කිරීමේ බලය සභාවට තිබිය යුතු අතර සභාව විසින්, ඔවුන්ගේ පාරිශ්‍රමික හා සේවා නියමයන් සහ කොන්දේසි නියම කළ යුතුය.

මුදල්.

9. (අ) සංගමයේ මුදල් වර්ෂය එක් එක් වර්ෂයේ ජනවාරි මස 1 වන දින ආරම්භ ව දෙසැම්බර් මස 31 වන දින අවසන් විය යුතුය.

(ආ) දායක මුදල්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ පැවරීම්, පරිත්‍යාග, ටිකට්, පත්‍රිකා, හා අන් පළකිරීම්, විකිණීම, ආයෝජනවල පොලිය යන මේවා සම්බන්ධයෙන් හෝ අන් කිසි ක්‍රමයකින් ලැබෙන සියලුම මුදල් මෙහි දැක්වෙන රීති අනුව සංගමයේ පරමාර්ථ කරගෙන යාම සඳහා යොදනු ලැබිය යුතුය.

(ඇ) සභාවේ විධානය අනුව සංගමයේ අරමුදල් පහත සඳහන්, එනම්, ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙහි, හෝ රජයේ අරමුදල්වල, ඉඩම් මිලට ගැනීම සඳහා කාර්යාල හෝ ඒ සම්බන්ධ අන් ගොඩනැගිලි තැනීම හෝ අලුත්වැඩියා කිරීම සඳහා හෝ භාර අරමුදල් ආයෝජනය කිරීම පිණිස තත් කාලයෙහි නීතියෙන් බලය පැවරුණු යම් ආයෝජනයක ආයෝජනය කරනු ලැබිය හැකිය.

(ඈ) සභාව විසින් ඉඩමක් මිලට ගැනීම හෝ බද්දට ගැනීම හා එකී ඉඩම විකිණීම, හුවමාරු කර ගැනීම, උකස් කිරීම, බද්දට දීම හෝ එකී ඉඩම මත ගොඩනැගිලි තැනීම කළ හැකි අතර, යම් ගොඩනැගිල්ලක් අලුත්වැඩියා කිරීමට, නඩත්තු කිරීමට හෝ බිඳ හෙළීමට ද එය නැවත ඉදිකිරීමට ද සභාවට බලය තිබිය යුතුය. එක් දේපළ හා ආයෝජන සම්බන්ධයෙන් වූ සියලු ගනුදෙනු සංගමයේ භාරකරුවන්ගේ නාමයෙන් විය යුතුය.

(ඉ) සංගමයේ කටයුතුවල කාර්ය සඳහා මුදල් ණයට ගැනීම සඳහා සභාවේ රැස්වීමක දී සම්මත කරගත් යෝජනාවක මාර්ගයෙන් බලය දෙනු ලැබුවහොත් සභාපති විසින් එසේ මුදල් ණයට ගත හැකිය. ණයට ගනු ලබන මුදල් සඳහා ඇප තැබිය යුතු ද යන්න යෝජනාවෙහි දක්වනු ලැබිය යුතු අතර එසේ වුවහොත් තැබිය යුතු ඇපයේ ස්වභාවය කුමක් විය යුතු ද යන්න එහි සඳහන් විය යුතුය; තව ද අවශ්‍ය වුවහොත් එකී කාර්යය සඳහා අවශ්‍ය වන යම් ලේඛනයක් ලියා අත්සන් කිරීම සඳහා එකී යෝජනා සම්මතයෙන් භාරකරුවන්ට බලය දිය යුතුය:

එසේ වුව ද එසේ ලියා අත්සන් කරනු ලබන ලේඛනය සභාව විසින් ප්‍රථමයෙන් අනුමත කරනු ලැබිය යුතුය. ඒ සඳහා අවශ්‍ය කවර හෝ අවස්ථාවක සභාව විසින් නීති උපදෙස් ලබා ගත යුතුය.

(ඊ) ගිණුම් ක්‍රියාත්මක කිරීම—සංගමයේ බැංකු ගිණුම ගරු භාණ්ඩාගාරික විසින් හෝ ගරු උපභාණ්ඩාගාරික විසින් හා පහත සඳහන් තැනැත්තන්ගෙන් කිනැම කෙනකු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතුය:—

(i) සංගමයේ සභාපති,

(ii) සභාවේ සභාපති,

(iii) ගරු ලේකම්, හෝ

(iv) ගරු උපලේකම්.

(උ) සභාව විසින් නියම කරනු ලැබූ ගාස්තුවක් පිට වාර්ෂික මහා සභා රැස්වීමක දී විගණකයකු හෝ විගණකයන් වර්ෂයක් පාසා තෝරා පත් කරනු ලැබිය යුතුය. මුදල් වර්ෂය අවසානයේ දී ගරු භාණ්ඩාගාරික විසින් හැකි ඉක්මණින් ඉදිරිපත් කරනු ලබන සංගමයේ ගණන් විගණනය කොට එසේ විගණනය කරනු ලැබූ ගණන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

10. (අ) සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීමක දී සංගමයේ සාමාජිකයන් අතුරෙන් භාරකරුවන් තිදෙනකු තෝරා පත් කරනු ලැබිය යුතුය. ඒ එක් එක් භාරකරු, සාමාජිකයකුව සිටීම නතර වන්නේ නම් හෝ මිය යාම හෝ දුබලතාව හේතුකොට ගෙන ධුරය දැරීමට අන් ආකාරයකින් නොහැකි වන්නේ නම් හෝ වාර්ෂික හෝ විශේෂ මහා සභා රැස්වීමක දී සම්මත කර ගනු ලැබූ යෝජනාවකින් ධුරයෙන් ඉවත් කරනු ලබන්නේ නම් මිස, වර්ෂ පහක කාලපරිච්ඡේදයක් තුළ ධුරය දැරිය යුතුය. භාරකරුවන්.

(ආ) මේ රීතියේ විධිවිධාන යටතේ යථා පරිදි තෝරා පත්කර ගනු ලැබූ භාරකරුවන් විසින් බැංකුවල හා අතෙහි ඇති මුදල් හැර සංගමයේ දේපළ සංගමය වෙනුවෙන් භාරයක් වශයෙන් දැරිය යුතුය. සංගමයේ මහා සභා රැස්වීමක දී සම්මත කර ගනු ලැබූ ද එකී රැස්වීමේ සභාපති හා ලේකම් විසින් යථා පරිදි සහතික කරනු ලැබූ ද භාර දේපළට අදාළ යෝජනාවේ පිටපතක් සමග එවනු ලැබිය යුතු සංගමයේ විධානයක් අනුව මිනා එකී දේපළ හා එයින් උපදින ආදායම සම්බන්ධයෙන් කටයුතු කිරීමට භාරකරුවන්ට හිමිකම් නොතිබිය යුතුය.

(ඇ) භාරකරුවකු ඔහුගේ ධුරයෙන් ඉදා හරිනු ලැබුවහොත් හෝ සාමාජිකත්වය නතරවීම, මියයාම, ඉල්ලා අස්වීම හෝ අන් හේතුවක් නිසා තම ධුරය දැරීම නතර වුවහොත්, එසේ භාරකරුවකුව සිටීම නතර වන එකී භාරකරු වෙනුවට අලුත් භාරකරුවකු සංගමයේ වාර්ෂික හෝ විශේෂ මහා සභා රැස්වීමක දී තෝරා පත්කර ගනු ලබන තෙක් සෙසු භාරකරුවන්ට තම යුතුකම් වලංගු ලෙස ඉටු කිරීමේ හිමිකම තිබිය යුතුය.

(ඈ) තත් කාලයෙහි බලපවත්නා අන් කිසි නීතියක් සමග කියවිය යුතු (87 වන අධිකාරය වූ) භාරකාර ආඥාපනතේ 113 වන වගන්තියේ විධිවිධාන අනුව එකී දේපළ සම්බන්ධ අයිතිය උරුම විය යුතුය.

11. සභාව විසින් කලින් කල විශේෂ කාර්යයන් සඳහා අවශ්‍ය යයි හෝ යෝග්‍ය යයි සභාව සලකන කමිටු පත් කරනු ලබන අතර, එවැනි යම් කමිටුවක් පත්කරන ලද්දේ යම් කාර්යයන් සඳහා ද ඒ කාර්යයන් කරගෙන යාම සඳහා එකී කමිටුවට අවශ්‍ය යයි සලකන සභාවේ කාර්යයන්ගෙන් හා යුතුකම් වලින් යම් කාර්යයන් හා යුතුකම් ඒ එක් එක් කමිටුව වෙත පැවරිය යුතුවාක් මෙන්ම සභාවේ බලතලවලින් යම් බලතල පැවරිය හැකිය. කමිටුව විසින් ස්වකීය සභාපති පත් කළ හැකිය. කමිටු.

සභාව විසින් පත්කරන ලද කමිටුවක සාමාජිකත්වය සභාවේ සාමාජිකයන්ට සීමා කිරීම අවශ්‍ය නොවේ.

කමිටුවකට අමතර සාමාජිකයන් තව තෝරා ගැනීමේ බලය සභාව විසින් එක් කමිටුව වෙත පැවරිය හැකි අතර සභාවේ අභිමතය පරිදි එසේ තව තෝරා ගනු ලබන සාමාජිකයන්ගේ ගණන සීමා කළ හැකිය. සභාව විසින් එක් එක් කමිටුව වෙත කරනු ලබන යම් විධානයකට යටත්ව ඒ එක් එක් කමිටුව විසින් ස්වකීය ක්‍රියා පරිපාටිය විධිමත් කළ යුතුය.

12. (අ) ගරු ලේකම් සංගමයේ හා සභාවේ සියලු ම රැස්වීම්වලට පැමිණ සිටිය යුතු අතර සභාවේ රැස්වීම්වල හා සංගමයේ යම් සාමාන්‍ය හෝ විශේෂ රැස්වීමක වාර්තා තැබිය යුතුය. ගරු ලේකම්.

(ආ) ඔහු විසින්, සභාවේ මාසික රැස්වීම් කැඳවීම හා විශේෂ රැස්වීමක් කැඳවීමට ඉල්ලා සිටිනු ලැබූ විට එසේ කැඳවීම කළ යුතු අතර, එකී එක් එක් රැස්වීමට පැමිණ සිටි නිලධරයන්ගේ හා සාමාජිකයන්ගේ නම් සභාපතිගේ අත්සනින් සහතික කළ යුතු පොතක නිවැරදිව වාර්තා ගත කළ යුතුය.

(ඇ) මේ රීතිවලින් හෝ සභාව විසින් නියම කෙරෙන පරිදි සංගමයේ සාමාජිකත්වයට ඇතුළත් වීම සඳහා වූ සියලු ඉල්ලීම් ඔහු විසින් භාරගෙන ඒ සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු අතර සාමාජිකයන්ගේ නාම ලේඛනය පවත්වාගෙන යා යුතුය.

(ආ) සභාපති හෝ සභාව හෝ මහා සභාවකට රැස්වූ සංගමය විසින් තමා වෙත කරනු ලැබූ විධාන අනුව ඔහු ක්‍රියා කළ යුතුමත් හැර ඔහුගේ එදිනෙදා කටයුතු සම්බන්ධයෙන් ඔහු සභාපතිගේ අනුපාලනය, පාලනය හා විධානය යටතේ ක්‍රියා කළ යුතුය.

(ඉ) සාමාජික නාමලේඛනය ද වාර්තා පොත ද සෙසු ලේඛන හා සංගමයේ වංචල දේපළ ද ඔහු විසින් ඔහු භාරයේ තබා ගත යුතුය. සභාවේ යෝජනා සම්මතයක මාර්ගයෙන් හෝ සභාපති විසින් හෝ ඔහුගේ ධුරයෙහි අනුප්‍රාප්තිකයා විසින් නියම කරනු ලැබූ කවර හෝ විටක දී ගරු ලේකම් විසින් ඒවායේ භාරය විධාන කෙරෙන පරිදි භාර දිය යුතුය.

(ඊ) ගරු ලේකම් විසින්, සභාවේ සභාපතිගේ අනුමතිය ඇතිව, තම කටයුතු හෝ යුතුකම් සියල්ලම හෝ ඉන් යමක් ගරු උපලේකම් වෙත පවරා දිය හැකිය. ගරු ලේකම් පැමිණ නොසිටින විටක දී ගරු ලේකම් වෙනුවට වැඩ බැලීමද ගරු උපලේකම් විසින් කළ යුතුය.

ගරු භාණ්ඩාගාරික.

13. (අ) ගරු භාණ්ඩාගාරිකගේ යුතුකම් පහත සඳහන් පරිදි විය යුතුය:—

(i) සභාව විසින් විධාන කෙරෙන පරිදි සංගමයේ සියලුම මුදල් හා අන් දේපළ භාරගෙන පාවිච්චි කිරීම, හා ඒවායේ නිසි ගණන් හා වාර්තා තැබීම,

(ii) සංගමයේ මුදල් තත්ත්වය සම්බන්ධයෙන් මාසික ප්‍රකාශයක් පිළියෙල කොට සභාව වෙත ඉදිරිපත් කිරීම, හා

(iii) වාර්ෂික ගණන් ප්‍රකාශයක් පිළියෙල කොට සභාව වෙත ඉදිරිපත් කිරීම.

(ආ) ගරු භාණ්ඩාගාරික විසින් සභාවේ සභාපතිගේ අනුමතිය ඇතිව තම කට යුතුවලින් හා යුතුකම්වලින් යම් කටයුතු හා යුතුකම් ගරු උපභාණ්ඩාගාරික වෙත පවරා දිය හැකිය. ගරු භාණ්ඩාගාරික පැමිණ නොසිටින විටෙක දී ඔහු වෙනුවට වැඩ බැලීම ද ගරු උප භාණ්ඩාගාරික විසින් කළ යුතුය.

මහා සභා රැස්වීම.

14. (අ) වාර්ෂික මහා සභා රැස්වීම—යටත් පිරිසෙයින් සති දෙකකටවත් කලින් දැනුම් දෙනු ලැබිය යුතු සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීම හැකි පමණින් එක් එක් වර්ෂයේ ජූනි මස තිස් වන දින ඉකුත් වීමට පෙර පවත්වනු ලැබිය යුතුය. එකී රැස්වීමේ දී—

(i) පූර්ව මුදල් වර්ෂය සඳහා සභාවේ වාර්තාව හා විගණනය කරනු ලැබූ ගණන් ඉදිරිපත් කරනු ලැබිය යුතුය;

(ii) නිලධරයන් හා සභාවේ සාමාජිකයන් තෝරා පත් කර ගනු ලැබිය යුතුය; තවද

(iii) සභාව විසින් නිශ්චිත කරනු ලැබූ අන් කිසි කටයුතු කරනු ලැබිය හැකිය.

සංගමයේ සභාපති සියලුම විශේෂ හා වාර්ෂික මහා සභා රැස්වීම්වල මූලාසනය දැරිය යුතුය. ඔහු පැමිණ නොසිටියහොත් උපසභාපතිවරයකු විසින් මූලාසනය දැරිය යුතුය. සභාපති හා උපසභාපති පැමිණ නොසිටි විට රැස්වීම විසින් එහි සභාපති තෝරා පත් කර ගනු ලැබිය යුතුය.

(ආ) විශේෂ මහා සභා රැස්වීම්—හදිසි කටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කිරීම පිණිස සංගමයේ විශේෂ මහා සභා රැස්වීම් සභාවේ අභිමතය පරිදි සභාව විසින් කැඳවනු ලැබිය හැකිය; එමෙන් ම ගරු ලේකම් වෙත එවනු ලැබූත් සංගමයේ විස්සකට අඩු නොවූ සාමාජිකයන් විසින් අත්සන් කරනු ලැබූත් ලිඛිත ඉල්ලීමක් ලැබීමෙන් පසු එක් මසක් ඇතුළත එකී විශේෂ මහා සභා රැස්වීම කැඳවනු ලැබිය යුතුය. රැස්වීමේ දී කිරීමට අදහස් කෙරෙන කටයුතු එකී ඉල්ලීමෙහි දක්වනු ලැබිය යුතු අතර එකී රැස්වීම පිළිබඳව දින පහළොවකට නොඅඩු කාලයකට කලින් දැන්වීම කරනු ලැබිය යුතුය. ඉහත දැක්වෙන කාලය ඇතුළත දී රැස්වීමක් කැඳවීමට ගරු ලේකම් අපොහොසත් වුවහොත් රැස්වීමක් කැඳවා දැනුම් දෙනු ලැබූ කටයුතු කිරීමට ඒ ඉල්ලීම කළ සාමාජිකයන්ට හිමිකම් තිබිය යුතුය.

(ඇ) සංගමයේ සියලුම මහා සභා රැස්වීම් සඳහා ගණපූරණය පැමිණ සිටින සාමාජිකයන් විස්සක් විය යුතුය: එසේ වුව ද ගණපූරණයක් නොතිබුණහොත් රැස්වීම දින දහහතරකට කල් දමනු ලැබිය යුතු අතර, දහහතර වන දිනයෙහි, පැමිණ සිටින සාමාජිකයන්ගේ ගණන නොතකා කලින් වූ න්‍යාය පත්‍රයේ කටයුතු සංගමය විසින් කරනු ලැබිය හැකිය.

අනුබද්ධ සංගම්.

15. ශ්‍රී ලංකා ලාදුරු රෝග මර්දන සංගමයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති සංගම් අනුබද්ධ කිරීමේ බලය සභාවට තිබිය යුතු අතර අනුබද්ධ සංගම් විසින් ගෙවිය යුතු ගාස්තු සභාව විසින් කලින් කල නියම කළ යුතුය.

විධිවිධාන සලස්වනු නොලැබූ කරුණු.

16. මේ රීතිවලින් නිශ්චිත වශයෙන් විධිවිධාන සලසනු නොලැබූ යම් ප්‍රශ්නයක් හෝ කරුණක් උද්ගත වුවහොත් හෝ එකී රීතිවල අර්ථනිරූපණය කිරීමෙහි දී යම් නොපැහැදිලි හෝ අනිශ්චිත භාවයක් ඇති වුවහොත් එකී ප්‍රශ්නය හෝ කරුණ සම්බන්ධයෙන් සභාවේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක විය යුතුය.

ව්‍යවස්ථාමාලාව හා රීති සංශෝධනය කිරීම.

17. මේ ව්‍යවස්ථාමාලාවට හෝ රීතිවලට කිසිම එකතු කිරීමක් හෝ ඉන් යමක් අත් හැරීමක් හෝ ඒවා පිළිබඳ සංශෝධනය කිරීමක් විශේෂ යෝජනා සම්මතයක් අනුව මිස කරනු නොලැබිය යුතුය. එකී යෝජනාව පිළිබඳ දැන්වීම දින අටකට නොඅඩු කාලයකට කලින් කරනු ලැබිය යුතුය. තවද තත් කාර්ය සඳහා යථා පරිදි කැඳවනු ලැබූ සංගමයේ විශේෂ මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු වැඩි ඡන්දයකින් එකී යෝජනාව සම්මත කරනු ලැබිය යුතුය.

නිදහස්වීම.

18. සංගමයේ සෑම නිලධරයකුම, ඔහු සෑම අවස්ථාවේ දී ම සද්භාවයෙන් සහ සංගමයේ ප්‍රයෝජනය හා යහපත තකා ක්‍රියා කරන්නේ ය යන විශ්වාසයෙන් ක්‍රියා කර සිටී නම්, යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සම්බන්ධයෙන් වූ යම් සිවිල් හෝ අපරාධ නීතිකෘත්‍යයක දී ඔහු විසින් දරනු ලබන වගකීම්වලින් සංගමයේ අරමුදල් යොදා නිදහස් කරනු ලැබිය යුතුය.